᯾ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2304/86 – 2022 නොවැම්බර් 05 වැනි සෙනසුරාදා – 2022.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/26.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.06.30 දිනැති හා අංක 2182/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.04.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 (නව ලිපිනය - දෙහිවල, නගර සභා පටුමඟ, අංක 10) හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (වයි. එල්. කල්‍යාණිලතා මිය වෙනුවෙන්) සහ බියගම, නිදහස් වෙළඳ කලාපය හි පිහිටි ඇගියෝ ටුබැකෝ පොසෙසින්ග් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරු - ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දී ය.

ගොනු අංකය: IR/COM/01/2018/26

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 259/9,
සෙත්සිරි මාවත,
කොස්වත්ත,
තලංගම.
(වයි. එල්. කල්‍යාණිලතා මිය වෙනුවෙන්)

*පළමු පාර්ශ්වය*

බේරුම්කරණ අංකය: A /11/2020

ඇගියෝ ටුබැකෝ පොසෙසින්ග් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
නිදහස් වෙළඳ කලාපය,
බියගම.

*දෙවැනි පාර්ශ්වය*

*අතර පවතින කාර්මික ආරාවුල*

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 1957 අංක 14 හා 1952 අංක 67 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකොට ඇත.

***ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :***

''2017-12-21 දින සිදුවූ සිද්ධියක් හේතුකොටගෙන පවත්වන ලද විනය පරීක්ෂණයකින් අනතුරුව 2018-07-07 වන දින සිට 2018-07-13 වන දින දක්වා දින 6 ක් සේවය අත්හිටුවමින් වැටුප කපා ගැනීම නිසා වයි. එල්. කල්‍යාණිලතා මිය වෙත අසාධාරණයක් සිදුවී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදු ව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ''

මෙම ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශ්වය වෙතම තම පළමු හා දෙවැනි ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට දන්වා තිබුනද දෙපාර්ශ්වය විසින්ම සිය පළමු ප්‍රකාශය පමණක් මෙම බේරුම්කරණය ඉදිරියේ ගොනුකර ඇත. ඉන් අනතුරුව දෙපාර්ශ්වයම බේරුම්කරණය සඳහා කැඳවා තිබුනද දිගින් දිගටම පළමු පාර්ශ්වය දින අයැදීම හෝ නොපැමිණීම යන හේතුවෙන් බේරුම්කරණ පරීක්ෂණය තවදුරටත් පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක් මතුව තිබුන අතර, දෙවැනි පාර්ශ්වය අවස්ථා කිහිපයකදීම මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙසට ඉල්ලීම් කර තිබුණි.

කෙසේ වෙතත් රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුකොටගෙන පාර්ශ්වයන් වෙත සාධාරණ කාලයක් ලබාදී අදාල බේරුම්කරණ පරීක්ෂණයට සහභාගී වීමට හැකිවන පරිදි දින කිහිපයක් ලබා දුන්නද පළමු පාර්ශ්වය එයට ද කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. කෙසේ වෙතත් 2022-08-17 දිනද මෙම ආරවුල විමර්ෂනය සඳහා දෙපාර්ශවය කැඳවා තිබුණද එදිනද දෙවැනි පාර්ශවය වන සේවායෝජක පාර්ශ්වය පමණක් විභාගය සඳහා සහභාගී වී තිබුණි. මෙදිනද දෙවැනි පාර්ශ්වය සිය දැඩි විරෝධය පලකරමින් මෙම ආරාවුල නිෂ්ප්‍රභා කරන ලෙසට ඉල්ලා සිටින ලදී. ඒ අනුව අවසාන වශයෙන් ලියාපදිංචි තැපෑලෙන් පළමු පාර්ශ්වය කැඳවීමට කටයුතු කරන ලෙසත් කැඳවීම් දිනය 2022-08-30 දිනට දින යොදන ලෙසත් නියම කරන ලදී.

ඒ අනුව 2022-08-30 දින පාර්ශ්වයන් දෙකම පැමිණිලි විභාගය සඳහා පැමිණ සිටි අතර, මෙම බේරුම්කරණ නඩුව තවදුරටත් පවත්වාගෙන යාමට සූදානම් ද යන්න පළමු පාර්ශ්වයෙන් විමසන ලදී. ඒ අවස්ථාවේදී පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිති නියෝජිත සුජීව සුහසිංහ මහතා පවසන ලද්දේ මෙම ඉල්ලුම්කාර සේවිකාව මේ වන විට වුදිත ආයතනයේ සේවයෙන් පහකර ඇති බවත්, ඒ හේතුව මත තමන්ට දැනට මෙම ඉල්ලුම්කාර සේවිකාව සම්බන්ධකර ගැනීමේ ගැටළුවක් පැන නැගී ඇති බවත්, ඒ අනුව මෙම බේරුම්කරණ නඩුව තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි බැවින් තමන් මෙම ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගන්නා බවයි.

දෙවැනි පාර්ශ්වයේ නීතිඥ රුවින්ද වැලිකල මහතා ප්‍රකාශ කර සිටියේ මෙම බේරුම්කරණ යොමුව විභාගයට ගන්නා ලද දිනයන් වූ 2022-03-25, 2022-06-28 හා 2022-08-17 වන දිනවලදී මෙම බේරුම්කරණ පරීක්ෂණය සඳහා පළමු පාර්ශ්වය කිසිදු දැනුම්දීමකින් තොරව ඊට සහභාගී නොවුන බවත්, ඒ අනුව මෙම බේරුම්කරණ යොමුව ප්‍රතික්ෂේප කරන මෙන් ඉල්ලා සිටිය යුතු බවත්, ඒ අනුව මෙම පැමිණිල්ල නිශ්ප්‍රභ කරන ලෙසටත් වේ.

### ප්‍රදානය

ඉහත දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සියල්ල සලකා බලා මෙම බේරුම්කරණ යොමුව සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂාකර ගෙන යාමට හැකියාවක් නොමැති බැවින්, එනම්, පළමු පාර්ශ්වයට තවදුරටත් මෙම බේරුම්කරණ යොමුව පවත්වාගෙන යාම පිළිබඳ උනන්දුවක් හා ඕනෑකමක් නොමැති බැව් අවබෝධ වන බැවින් මෙම බේරුම්කරණ යොමුව ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළෙමි.

ඒ අනුව මෙම බේරුම්කරණ යොමුව තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි බැවින් හා ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය තවදුරටත් මෙම යොමුව පවත්වාගෙන යාමට සූදානම් නොමැති බැවින් ඉහත මා වෙත යොමුකර ඇති බේරුම්කරණ යොමුව ප්‍රතික්ෂේප කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයකි.

ඔබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින.

EOG 11-0057

---

මගේ අංකය: CI/175/2004.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.07.09 දිනැති හා අංක 2183/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.04.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, (වර්තමාන ලිපිනය - දෙහිවල, නගර සභා පටුමග, අංක 10) හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය සහ 1. කොලොන්නාව, තැ.පෙ. 06, හි පිහිටි චෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පීඑල්සී (පැරණි නාමයඃ කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්) 2. කඩවත, පහළ බියන්විල, අංක 114/ඒ පදිංචි එන්. එච්. ඒ. සෝමපාල මහතා අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.10.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 259/9,
සෙත්සිරි මාවත,
කොස්වත්ත,
තලංගම.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: A /34/2020
ගොනු අංකය: IC/175/2004

එදිරිව
චෙව්රෝන් ලුබ්රිකන්ට් ලංකා පීඑල්සී
(පැරණි නාමය - කැල්ටෙක්ස් ලුබ්රිකන්ට් ලංකා ලිමිටඩ්)
තැ.පෙ. 06,
කොලොන්නාව.

එන්. එච්. ඒ. සෝමපාල මහතා
නො 114/ඒ,
පහල බියන්විල,
කඩවත.

*දෙවැනි පාර්ශ්වය*

**ප්‍රදානය**

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 හා 1952 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ එතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල් බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට එකී ආරාවුල මා වෙත යොමු කර ඇත. එකී යොමු ලිපිය සමග කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මැතිතුමා විසින් අදාළ පාර්ශ්ව අතර ආරාවුලට හේතු වී ඇති කරුණ වශයෙන් ''චෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී, (පැරණි නාමය කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්) හි සේවය කල පහත නම් සඳහන් සේවකයන් හතරදෙනා එන්.එච්.ඒ සෝමපාල යන අයගේ සේවකයන් බව පවසමින් ඔහු මගින් ඔවුන්ගේ සේවය අවසන් කිරීම සාධාරණ සහ යුක්ති සහගත වන්නේද එසේ නොවන්නේ නම් ඔවුන්ට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

1. ටී. මර්වින් පෙරේරා මයා
2. කේ. ඒ. සමන්ත මයා

3. එච්.ඩබ්. ගුණපාල මයා
4. ආර්.එම්.ඩබ්.යූ. බණ්ඩාර මයා

යන අයගේ නම් සමග සඳහන් කරමින් කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ මා වෙත යොමු කර ඇත.

ඒ අනුව සළකා බැලීමේදී සේවා සමාප්තියට අදාළ මෙම නඩුව කම්කරු ආරාවුල් පනතේ 4 (1) වගන්තිය අනුව ගොනුකර ඇත්තේ අන්තර් සමාගම් සේවක සංගමය විසින් වන අතර එකී අදාළ සේවකයන් කිසි දිනක බේරුම්කරණය වෙත පැමිණ නැත. එසේම දෙපාර්ශවයේ ප්‍රකාශ ගොනු කරන ලෙස අදාළ ලිපිනයන්ට අවස්ථා ගණනාවකදී දන්වා යවා ඇතත්, එකී කිසිදු පාර්ශවයක් මේ වන තුරු කිසිදු විස්තර ප්‍රකාශයක් ගොනු කර නැති අතර ලිපිනය නිවැරදි නොවන බවට සහ එන්.එච්.ඒ. සෝමපාල යන අය මියගොස් ඇති බවට ලිපිකවර වල සඳහන් කර ඒ සියල්ල ආපසු ලැබී ඇති බවද නිරීක්ෂණය වේ.

දෙපාර්ශවයේ එක් පාර්ශවයක් හෝ විස්තරාත්මක ප්‍රකාශ ගොනු කර නැති අතර, දිගින් දිගටම කරන ලද දැනුම් දීම් අනුව 2022.06.28 වන දින අන්තර් සේවක සංගමය දුරකථනයෙන් කාර්යාලයට දන්වා ඇත්තේ මෙම නඩුවේ පළමු පාර්ශවයේ සේවකයන් වන

1. ටී. මර්වින් පෙරේරා මයා
2. කේ. ඒ. සමන්ත මයා
3. එච්.ඩබ්. ගුණපාල මයා
4. ආර්.එම්.ඩබ්.යූ. බණ්ඩාර මයා

යන සේවකයන් සොයාගත නොහැකි බවත් එබැවින් මෙම නඩුව පවත්වාගෙන යා නොහැකි බවත්, එසේ හෙයින් තම සංගමය මෙම නඩුවෙන් ඉවත්වී ඉල්ලා අස්කර ගැනීම සඳහා ලිඛිතව දැන්වීමට කටයුතු කරන බවත්ය. ''චෙව්රොන් ලුබ්රිකන්ට්ස් ලංකා පීඑල්සී'' ආයතනය වෙනුවෙන් බේරුම්කරණය වෙත මානව සම්පත් කළමනාකාරිණී මහේෂිනි හමංගොඩ මහත්මිය සහ විධායක මානව සම්පත් කළමණාකරු තුෂාර හමංගොඩ යන අය පෙනී සිටි අතර ඔවුන් ප්‍රකාශ කර සිටින්නේ ඉහත නම් සඳහන් සේවකයන් තම ආයතනයේ සේවකයන් නොවන බවත්, එන්.එච්.ඒ සෝමපාල මහතා යටතේ රැකියා සපයන ආයතනයක් පැවති බවත් ඔහු විසින් එම සේවකයන්ට රැකියාව ලබාදී වැටුප් ගෙවා ඇති බවත් සේවා සැපයීම සඳහා සෝමපාල මහතා යන අය සමග සේවා ගිවිසුමක් අනුව ඔහුට ගෙවිය යුතු මුදල් ගෙවා ඇති බවත්ය. ඊට අදාළ ගිවිසුම ඉදිරිපත් කළ හැකි බව ප්‍රකාශ කළ අතර එසේ කරන ලෙසට නියෝග කර ඇතත් මෙතෙක් එම කටයුත්ත ඉටුකර නැත. එසේම 2022.09.16 වන දින අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් වශයෙන් නීතිඥ ජානක අධිකාරි මහතාගේ අත්සනින් යුතුව මෙම බේරුම්කරණයට අදාළ සේවකයන් ඒ සඳහා කිසිදු උනන්දුවක් නොදක්වන හෙයින් මෙම බේරුම්කරණ ක්‍රියාවලිය ඉදිරියට පවත්වාගෙන යා නොහැකි බව දන්වා බේරුම්කරණ ක්‍රියාවලිය අවසන් කිරීමට කටයුතු කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරුණු සියල්ල සහ ඉහත සඳහන් පැමිණිල්ල ඉදිරිපත් කර ඇති අන්තර් සමාගම් සේවක සංගමයේ ඉල්ලීම සහ බේරුම්කරණයට අදාළ සේවකයන්ගේ ඉදිරිපත් නොවීම සහ උනන්දුවක් නොදක්වීම ඇතුළුව සේවය කලා යැයි කියනු ලබන සේවකයන් සපයන ලද බවට ප්‍රකාශිත ආයතනයේ හිමිකරු සෝමපාල යන අය ජීවතුන් අතර නැති බවට ලැබී ඇති තොරතුරු යන කරුණු සියල්ල සලකා බැලීමෙන් පසුව මෙම බේරුම්කරණ ක්‍රියාවලිය තවදුරටත් පවත්වාගෙන යාමේ හැකියාවක් නොපවතින බැවින් බේරුම්කරණයට අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් අදාළ ගොනුව පියවා තැබීමට කටයුතු කරමි.

මෙම බේරුම්කරණයට ඉදිරිපත් වූ සියළු කරුණු සලකා බලා ගන්නා ලද මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත තීන්දු ප්‍රදානයක් බවද ප්‍රකාශ කර සිටිමි.

විතාරණගේ ජයරත්න,
බේරුම්කරු.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින.

EOG 11-0058